| ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය<br>උපදේශක චක්‍රලේඛය 2004/පුස/02(අ) (සංශෝධිත 2019) |
|---|

## පාසල්වල " ජාතික කියවීමේ මාසය වැඩසටහන - ඔක්තෝබර් " ක්‍රියාත්මක කිරීම

### 01. හැඳින්වීම

2004 වසරේ සිට ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර ඇත. 2019 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීමේ මාසයට සමගාමීව කියවීම් ප්‍රවර්ධනය සඳහා **විශේෂ** වැඩසටහන් සහ **විශේෂ** ව්‍යාපෘති ක්‍රියාත්මක කරන මෙන් සියලුම පාසල් පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. 2018 වර්ෂයේ සිට ජාතික කියවීමේ මාසය සඳහා නිශ්චිත තේමාවක් යටතේ වැඩසටහන් සංවිධානය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කරන ලදී. **"කියවන සමාජයක ඇරඹුම දරුවාගෙන් පටන් ගනිමු"** යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිත ය .

### 02. කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුව

ජාතික කියවීමේ මාසය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම සඳහා ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම සුදුසු ය. දැනට ක්‍රියාත්මක පුස්තකාල කමිටුව මගින් (අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල උපදෙස් සංග්‍රහයට අනුව පාසල් පුස්තකාල කමිටුවක් තිබීම අනිවාර්ය වේ.) මෙම කටයුතු සිදු කළ හැකි අතර, එසේ නොමැති නම් ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත් කර ගැනීම සුදුසු ය. එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- විදුහල්පතිතුමා / නියෝජ්‍ය විදුහල්පතිතුමා - කමිටු සභාපති
- ගුරු පුස්තකාලයාධිපති / පුස්තකාලයාධිපති හෝ පුස්තකාලය භාර නිලධාරී - කමිටු ලේකම්
- විදුහල්පතිතුමා/තුමිය විසින් නම් කරනු ලබන වෙනත් ගුරුවරුන් දෙදෙනෙක්
- ගුරු දෙගුරු සංගමයේ සාමාජික මහත්ම මහත්මීන් දෙදෙනෙක්
- ශිෂ්‍ය නියෝජිතයින් හයදෙනෙක්

### 03. තේමාවට අදාළව ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන්

- තේමාවට අදාළව පුස්තකාලය සතු විවිධ ශානර (වර්ග/කාණ්ඩ) යටතේ ඇති ග්‍රන්ථ එකතුව හඳුනා ගැනීම
    - නිර්මාණාත්මක ළමා සාහිත්‍ය
    - සාමාන්‍ය කෘති
    - ශාස්ත්‍රීය කෘති
    - විචාර ග්‍රන්ථ ( ළමා කෘති පිළිබඳව ලියැවුණු)
    - චරිතාපදාන

- එම ග්‍රන්ථ එකතුව වර්ෂය තුළ විශේෂිතව සංවිධානය කර ප්‍රචාරණය කිරීම හා පාඨක කියවීම ප්‍රවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- යෝජිත තේමාවට අදාළව දැනට පුස්තකාල එකතුවේ නොමැති දේශීය / විදේශීය විවිධ ග්‍රන්ථ හඳුනාගැනීම හා එම ග්‍රන්ථ අත්පත් කර ගැනීමට කටයුතු කිරීම.
- පාඨක නිර්මාණශීලීත්වය එළිදැක්වෙන නිර්මාණ ඇතුළත් සඟරාවක් එළිදැක්වීම.
- බිත්ති පුවත්පත්, ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා, පුවත්පත් කැපුම් එකතු එළිදැක්වීම
- විශේෂ තරග පැවැත්වීම
- සම්මන්ත්‍රණ හා දේශන සංවිධානය කිරීම
- බැනර්/උදෘත පාඨ හා පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම, අත් පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම
- පොත් ප්‍රදර්ශන පැවැත්වීම
- අන්තර්ජාලය හරහා තේමාවට අදාළ තොරතුරු ගවේෂණය කර සකස් කරන ලද පරිගණක වැඩසටහන් නිර්මාණය කිරීම.
- දරුවන්ගේ රසඥතාවය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් කතන්දර පැය, ළමා චිත්‍රපට, ළමා නාට්‍ය වැනි රසවින්දනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තෝරා ගනු ලැබූ දේශීය සඟරාවක් හෝ සඟරා කිහිපයක් ඇසුරින් විද්වත් සාකච්ඡාවක් /කතිකාවක් හෝ ශාස්ත්‍රීය මට්ටමේ නිර්මාණාත්මක වැඩසටහන් සංවිධානය කිරීම.
(ප්‍රලේඛ, සංස්කෘති,දෙසතිය.. වැනි.)

## 04. පොදුවේ ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන්

- කියවීම් කඳවුරු, කියවීමේ තරග සංවිධානය කිරීම
- පාඨක සමාජ පිහිටුවීම සහ වැඩිදියුණු කිරීම
- පුස්තකාල සාමාජිකත්වය වර්ධනය කිරීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම
- ඉටු කරනු ලබන වැඩසටහන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල පළ කිරීම
- කුසලතා ඇගයීම සඳහා ත්‍යාග හා සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයක් සංවිධානය කිරීම
- කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධ වෙනත් නිර්මාණශීලී වැඩසටහන් සංවිධානය කිරීම

## 05. අරමුදල්

- මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම කළ යුතු නොවේ. ඔබ විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිති අරමුදලින් කොටසක් ද, පුස්තකාල අරමුදලින් කොටසක් ද යෙදවීම ප්‍රමාණවත් වේ.

## 06. වාර්තාව සකස් කිරීම

- පුස්තකාලවලින් සිදු කරන ලද වැඩසටහන් පිළිබඳ වාර්තාවක්, ඡායාරූප/සංයුක්ත තැටි හා වෙනත් සාධක සහිතව සකස් කොට විදුහල්පතිවරයාගේ නිර්දේශය සහිතව ***2020 පෙබරවාරි මස 28*** වන දින හෝ ඊට පෙර ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07*** යන ලිපිනයට වාර්තාව එවිය යුතුය.

- ජාතික කියවීමේ මාසයේ ජයග්‍රාහක පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සකස් කිරීමේදී ඉහත දක්වන ලද වැඩසටහන් ඇතුළුව කියවීම ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා පමණක් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කෙරේ.එබැවින් පුස්තකාලය විසින් කරන ලද වෙනත් ප්‍රජා සේවාවන් සම්බන්ධ තොරතුරු වාර්තාවට ඇතුළත් නොවිය යුතුය. උදා: ශ්‍රමදාන / දන්සැල් / ලේ දන්දීම
- වාර්තාව සකස් කිරීමේදී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා වියදමක් වැයකර කලාත්මක වටිනාකම් සහිතව සකස් කිරීම අනවශ්‍ය වන අතර පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදු කළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව ඡායාරූප හා තහවුරු කළ හැකි වෙනත් සාධක සහිතව විධිමත් අයුරින් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

## 07. ඇගයීම

- 2019 ජාතික කියවීමේ මාසයේ ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2020 ජාතික කියවීමේ මාසයේ රාජ්‍ය උත්සවයේ දී සහතිකපත් සහ සම්මාන පිරිනමනු ලැබේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් අවසන් වශයෙන් තේරී පත්වන පුස්තකාල නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අදාළ පුස්තකාලය සඳහා හිමිවන සම්මාන කවරේද යන්න තීරණය කරනු ලැබේ.

නීතිඥ පී. එම්. දීපාල් චන්ද්‍රරත්න
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, සිදම්ස් මාවත,
කොළඹ 07


නීතිඥ පී.එම්. දීපාල් චන්ද්‍රරත්න

සභාපති

විමසීම - විමසීම - දුරකථන අංකය - 011-2698847 / 011-2674387

වෙබ් අඩවිය - www.natlib.lk

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

උපදේශක චක්‍රලේඛය 2004/පුස/02(අ) (සංශෝධිත 2019)

**ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන / විද්‍යා පීඨ / කාර්මික විද්‍යාලවල**

**" ජාතික කියවීමේ මාසය වැඩසටහන - ඔක්තෝබර්" ක්‍රියාත්මක කිරීම**

## 01. හැඳින්වීම

2004 වසරේ සිට ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර ඇත. 2019 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීමේ මාසයට සමගාමීව කියවීම ප්‍රවර්ධනය සඳහා **විශේෂ වැඩසටහන්** සහ **විශේෂ ව්‍යාපෘති** ක්‍රියාත්මක කරන මෙන් සියලුම සංස්කෘතික මධ්‍යස්ථාන/ විද්‍යාපීඨ/ කාර්මික විද්‍යාල පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. 2018 වර්ෂයේ සිට ජාතික කියවීමේ මාසය සඳහා නිශ්චිත තේමාවක් යටතේ වැඩසටහන් සංවිධානය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කරන ලදී. **"කියවන සමාජයක ඇරඹුම දරුවාගෙන් පටන් ගනිමු"** යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිත ය .

## 02. කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුව

ජාතික කියවීමේ මාසය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම සඳහා "කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක්" පත් කර ගැනීම සුදුසු ය. දැනට පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මගින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැකි අතර, ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත් කර ගැනීම ද සුදුසු ය. එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- ආයතන ප්‍රධානියා හෝ නියෝජ්‍ය ප්‍රධාන - කමිටු සභාපති
- පුස්තකාලයාධිපති/භාරකරු - කමිටු ලේකම්
- විෂය භාර නිලධාරීන් දෙදෙනෙක්
- ආයතන ප්‍රධානියා විසින් නම් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙක් (ශිෂ්‍ය, ශිෂ්‍යාවන් ඇතුළුව)

## 03. තේමාවට අදාළව ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන්

- තේමාවට අදාළව පුස්තකාලය සතු විවිධ ශාඛා (වර්ග/කාණ්ඩ) යටතේ ඇති ග්‍රන්ථ එකතුව හඳුනා ගැනීම
  - නිර්මාණාත්මක ළමා සාහිත්‍ය ග්‍රන්ථ
  - ශාස්ත්‍රීය කෘති
  - විචාර කෘති ( ළමා කෘති පිළිබඳව ලියැවුණු)
  - චරිතාපදාන

- එම ග්‍රන්ථ එකතුව වර්ෂය තුළ විශේෂිතව සංවිධානය කර ප්‍රචාරණය කිරීම හා පාඨක කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- යෝජිත තේමාවට අදාළව දැනට පුස්තකාල එකතුවේ නොමැති දේශීය / විදේශීය විවිධ ග්‍රන්ථ හඳුනාගැනීම හා එම ග්‍රන්ථ අත්පත් කර ගැනීමට කටයුතු කිරීම.
- පාඨක නිර්මාණශීලීත්වය එළිදැක්වෙන නිර්මාණ ඇතුළත් සඟරාවක් එළිදැක්වීම.
- බිත්ති පුවත්පත්, ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා, පුවත්පත් කැපුම් එකතු එළිදැක්වීම
- විශේෂ තරග පැවැත්වීම (රචනා, චිත්‍ර, කථික, විවාද, නාට්‍ය, ගායනා)
- සම්මන්ත්‍රණ හා දේශන සංවිධානය කිරීම
- බැනර්/උද්‍ධෘත පාඨ හා පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම, අත් පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම
- පොත් ප්‍රදර්ශන පැවැත්වීම
- අන්තර්ජාලය හරහා තේමාවට අදාළ තොරතුරු ගවේෂණය කර සකස් කරන ලද පරිගණක වැඩසටහන් නිර්මාණය කිරීම.
- පාඨක රසඥතාවය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් චිත්‍රපට, නාට්‍ය වැනි රසවින්දනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තෝරා ගනු ලැබූ දේශීය සඟරාවක් හෝ සඟරා කිහිපයක් ඇසුරින් විද්වත් සාකච්ඡාවක් /කථිකාවක් හෝ ශාස්ත්‍රීය මට්ටමේ නිර්මාණාත්මක වැඩසටහන් සංවිධානය කිරීම.
  (ප්‍රලේඛා, සංස්කෘති,දෙසතිය.. වැනි.)

## 04. පොදුවේ ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන්

- කියවීම් කඳවුරු, කියවීමේ තරග සංවිධානය කිරීම
- පාඨක සමාජ පිහිටුවීම සහ වැඩිදියුණු කිරීම
- පුස්තකාල සාමාජිකත්වය වර්ධනය කිරීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම
- ඉටු කරනු ලබන වැඩසටහන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම.
- කුසලතා ඇගයීම සඳහා ත්‍යාග හා සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයක් සංවිධානය කිරීම
- කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධ වෙනත් නිර්මාණශීලී වැඩසටහන් සංවිධානය කිරීම

## 05. අරමුදල්

- මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම කළ යුතු නොවේ. ආයතනයේ පොදු අරමුදලින් කොටසක් ද, පුස්තකාල අරමුදලින් කොටසක් ද යෙදවීම ප්‍රමාණවත් වේ. මේ සඳහා ව්‍යාපෘති කමිටුව සම්බන්ධ කර ගත යුතුය.

## 06. වාර්තාව සකස් කිරීම

- සිදු කරන ලද සියලුම වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් (මුද්‍රිත/සංයුක්ත තැටි) සකස් කර ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ***2020 පෙබරවාරි මස 28*** වන දින හෝ ඊට පෙර ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07*** යන ලිපිනයට වාර්තාව එවිය යුතුය.

- ජයග්‍රාහී පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සකස් කිරීමේ දී, ඉහත දක්වන ලද වැඩසටහන් ඇතුළුව කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා පමණක් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ. එබැවින් පුස්තකාලය විසින් කරන ලද වෙනත් ප්‍රජා සේවාවන් සම්බන්ධ තොරතුරු වාර්තාවට ඇතුළත් නොකළ යුතුය.
  උදා: ශ්‍රමදාන / දන්සැල් / ලේ දන්දීම

- වාර්තාව සකස් කිරීමේ දී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා මුදලක් වැය කිරීම අවශ්‍ය නොවේ. පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදු කළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව ඡායාරූප හා තහවුරු කළ හැකි වෙනත් සාධක සහිතව විධිමත් අයුරින් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

## 07. ඇගයීම

- 2019 ජාතික කියවීමේ මාසයේ ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2020 ජාතික කියවීමේ මාසයේ රාජ්‍ය උත්සවයේ දී සහතිකපත් සහ සම්මාන පිරිනමනු ලැබේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් අවසන් වශයෙන් තේරී පත්වන පුස්තකාල නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අදාළ පුස්තකාලය සඳහා හිමිවන සම්මාන කවරේද යන්න තීරණය කරනු ලැබේ.

නීතිඥ පී.එම්. දිපාල් චන්ද්‍රරත්න
සභාපති

නීතිඥ පී. එම්. දිපාල් චන්ද්‍රරත්න
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07

විමසීම - විමසීම - දුරකථන අංකය - 011-2698847 / 011-2674387
වෙබ් අඩවිය - www.natlib.lk

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
උපදේශක චක්‍රලේඛය 2004/පුස/02(අ) (සංශෝධිත 2019)

පළාත් පාලන ආයතනවලට සම්බන්ධ මහජන පුස්තකාලයන්හි
"ඔක්තෝබර් - ජාතික කියවීමේ මාසය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම

## 01. හැඳින්වීම

2004 වසරේ සිට ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මඟින් ප්‍රකාශයට පත් කර ඇත. 2019 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීමේ මාසයට සමගාමීව කියවීම ප්‍රවර්ධනය සඳහා **විශේෂ වැඩසටහන්** සහ **විශේෂ ව්‍යාපෘති** ක්‍රියාත්මක කරන මෙන් සියලුම මහජන පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. 2018 වර්ෂයේ සිට ජාතික කියවීමේ මාසය සඳහා නිශ්චිත තේමාවක් යටතේ වැඩසටහන් සංවිධානය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කරන ලදී. **"කියවන සමාජයක ඇරඹුම දරුවාගෙන් පටන් ගනිමු"** යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිත ය .

## 02. ව්‍යාපෘති කමිටුව

මෙහිදී වැඩසටහන් සංවිධානය කිරීම සඳහා කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම සුදුසු ය. දැනට පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මඟින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැක. මේ සඳහා ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත් කර ගැනීම ද සුදුසු වන අතර එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- ආයතන ප්‍රධානියා හෝ නියෝජ්‍ය ප්‍රධානියා - කමිටු සභාපති
- නාගරික කොමසාරිස් හෝ පළාත් පාලන ආයතනයේ ලේකම් - උප සභාපති
- පුස්තකාලයාධිපති/ භාරකරු - කමිටු ලේකම්
- ප්‍රජා සංවර්ධන නිලධාරී
- ආයතන ප්‍රධානියා විසින් නම් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙක් (ප්‍රාදේශියව ඇගයීමට ලක් වූ ලේඛකයෙක්,කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරු උපදේශකවරයෙක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා සංවර්ධන නිලධාරී හෝ සංස්කෘතික නිලධාරී යන අය අතුරෙන් මෙම තිදෙනා තෝරා ගන්නේ නම් මැනවි.)

## 03. තේමාවට අදාළව ක්‍රියාත්මක කළ හැකි විශේෂ වැඩසටහන්

- තේමාවට අදාළව පුස්තකාලය සතු විවිධ ශාඛා (වර්ග/කාණ්ඩ) යටතේ ඇති ග්‍රන්ථ එකතුව හඳුනා ගැනීම
    - නිර්මාණාත්මක ළමා සාහිත්‍ය ග්‍රන්ථ
    - ශාස්ත්‍රීය කෘති
    - විචාර කෘති ( ළමා කෘති පිළිබඳව ලියැවුණු)
    - චරිතාපදාන

- එම ග්‍රන්ථ එකතුව විශේෂිත ක්‍රමයක් යටතේ සංවිධානය කර වර්ෂය පුරා ප්‍රචාරණය කිරීම සහ පාඨක කියවීම් ප්‍රවර්ධනය ඉලක්ක කොට ගනිමින් කටයුතු කිරීම.
- යෝජිත තේමාවට අදාළව දැනට පුස්තකාල එකතුවේ නොමැති දේශීය / විදේශීය ග්‍රන්ථ හඳුනා ගැනීම සහ එම ග්‍රන්ථ අත්පත් කර ගැනීමට කටයුතු කිරීම.
- පාඨක නිර්මාණශීලීත්වය එළිදැක්වෙන නිර්මාණ ඇතුළත් සඟරා, බිත්ති පුවත්පත් එළි දැක්වීම.
- අනුක්‍රමණිකා, පුවත්පත් කැපුම් එකතු පාඨක පරිශීලනයේ පහසුව උදෙසා සකස් කිරීම.
- විශේෂ තරග පැවැත්වීම.
- සම්මන්ත්‍රණ හා දේශන සංවිධානය කිරීම. (ප්‍රදේශයේ ජීවත්වන, ප්‍රබන්ධකරණයේ යෙදෙන ලේඛකයන්,විද්වතුන් සම්බන්ධ කර ගැනීම වඩා උචිතය)
- පුස්තකාලයේ ප්‍රචාරණය උදෙසා ඵලදායී ප්‍රචාරණාත්මක විධික්‍රම අනුගමනය කිරීම.
- පොත් ප්‍රදර්ශන පැවැත්වීම හා සංවිධානය කිරීම.
- අන්තර්ජාලය හරහා තේමාවට අදාළ තොරතුරු ගවේෂණය කර සකස් කරන ලද පරිගණක වැඩසටහන් නිර්මාණය කිරීම
- දරුවන්ගේ රසඥතාවය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් කතන්දර පැය, ළමා චිත්‍රපට, ළමා නාට්‍ය වැනි රසවින්දනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තෝරා ගනු ලැබූ දේශීය සඟරාවක් හෝ සඟරා කිහිපයක් ඇසුරින් විද්වත් සාකච්ඡාවක් /කතිකාවක් හෝ ශාස්ත්‍රීය මට්ටමේ නිර්මාණාත්මක වැඩසටහන් සංවිධානය කිරීම.
  (ප්‍රලේඛ, සංස්කෘති,දෙසතිය.. වැනි.)

## 04. පොදුවේ ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන්

- කියවීම් කඳවුරු, කියවීමේ තරග සංවිධානය කිරීම.
- පාඨක සමාජ පිහිටුවීම සහ එහි ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීම.
- පුස්තකාල සාමාජිකත්වය වර්ධනය කිරීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
- පළාතේ අනෙකුත් පුස්තකාල සමඟ කියවීම් ප්‍රවර්ධන සහයෝගිතා වැඩසටහන් සංවිධානය කිරීම.
- පළාත් පාලන බල ප්‍රදේශයට අයත් සෑම නිවසකම පුස්තකාලයක් යන සංකල්පය තේමා කොට ගනිමින් අවම වශයෙන් පොත් රාක්කයකින් සමන්විත ගෘහස්ත පුස්තකාලයක් ආරම්භ කිරීම. ඒ සඳහා ඵලදායී ප්‍රචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පුස්තකාලයේ මුහුණු පොතට (face book) මෙතෙක් සම්බන්ධ වී නොමැති පාඨකයන් හඳුනා ගෙන ඔවුන් ඒ සඳහා සම්බන්ධ කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ එහි කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධ උධෘත හා අදහස් හුවමාරු කර ගැනීම.
- පුස්තකාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම.
- කුසලතා ඇගයීම සඳහා ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයක් සංවිධානය කිරීම.
- ළමා කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධ වෙනත් නිර්මාණශීලී වැඩසටහන් සංවිධානය කිරීම.

## 05. අරමුදල්

මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම් සිදු නොකළ යුතුය. අවශ්‍ය අරමුදල් සපයා ගැනීම අදාළ පළාත් පාලන ආයතනය මඟින් හෝ පුස්තකාල මඟින් සිදු කළ හැකිය.

## 06. වාර්තාව සකස් කිරීම

සිදු කරන ලද සියලුම වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් (මුද්‍රිත/සංයුක්ත තැටි) සකස් කර අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ***2020 පෙබරවාරි මස 28*** වන දින හෝ ඊට පෙර *අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07* යන ලිපිනයට වාර්තාව එවිය යුතුය.

- ජයග්‍රාහී පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සකස් කිරීමේ දී, ඉහත දක්වන ලද වැඩසටහන් ඇතුළුව කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා පමණක් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ. එබැවින් පුස්තකාලය විසින් කරන ලද වෙනත් ප්‍රජා සේවාවන් සම්බන්ධ තොරතුරු වාර්තාවට ඇතුළත් නොකළ යුතුය.

  උදා: ශ්‍රමදාන / දන්සැල් / ලේ දන්දීම්

- වාර්තාව සකස් කිරීමේ දී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා මුදලක් වැය කිරීම අවශ්‍ය නොවේ. පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදු කළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව ඡායාරූප හා තහවුරු කළ හැකි වෙනත් සාධක සහිතව විධිමත් අයුරින් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

## 07. ඇගයීම

- ජාතික කියවීමේ මාසය 2019 ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2020 ජාතික කියවීමේ මාසයේ රාජ්‍ය උත්සවයේ දී ත්‍යාග, සහතිකපත් හා සම්මාන පිරිනමනු ලැබේ. ඇගයීම් කටයුතු පුස්තකාල මට්ටමින් සිදුකරන බැවින් එක් එක් පළාත් පාලන ආයතන සතු මහජන පුස්තකාල හා ශාඛා පුස්තකාල වෙන් වෙන් වශයෙන් වාර්තා එවිය යුතුය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් අවසන් වශයෙන් තේරී පත්වන පුස්තකාල නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අදාළ පුස්තකාලය සඳහා හිමිවන සම්මාන කවරේද යන්න තීරණය කරනු ලැබේ.

නීතිඥ පී.එම්. දීපාල් චන්ද්‍රරත්න
සභාපති

නීතිඥ පී. එම්. දීපාල් චන්ද්‍රරත්න
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07

විමසීම් - දුරකථන අංකය - 011-2698847 / 011-2674387

වෙබ් අඩවිය - www.natlib.lk